හාස්‍යෝත්පාදක නවකතාවේ සිංහල ලකුණ
රදළ පිළිරුව

උපහාස රසය උත්කර්ෂවත් ලෙස නවකතාවට යා කළ අසල්වැසි දේශයේ චේතන් භගට් වැනි නවකතාකරුවන්ගේ නිර්මාණ කියවූ මේ රටේ ඇතැම් ලේඛක-පාඨක පාර්ශ්වයන් ප්‍රශ්න කර සිටියේ, බොහෝ දේ විකාරරූපීව සිදුවන මෙවැනි රටක එවැනි අපූර්වාකාර උපහාස කතා රචකයන් බිහි නොවූයේ ඇයි දැයි කියා ය. මෙසේ ප්‍රශ්න කළ පිරිසට **සාහිත්‍ය චක්‍රවර්ති බඩ්ල්යු. ඒ. සිල්වාගේ 'රදළ පිළිරුව'** අමතක වුණේ දැයි අපට සිතුණේ මෑත දිනෙක මේ නවකතාවේ පස්වන මුද්‍රණය (2005 වසරේ ගොඩගේ ප්‍රකාශනයක් ලෙස එළිදුටු) යළි කියවා බලන විට ය.

අවුරුදු හැට හැත්තෑවකට පෙර මේ රටේ විසූ, (රදළයකු ලෙස පෙනී සිටින්නට වැරවෑයම් කළ) මිනිසකුගේ දිවිසැරිය පසුබිම්ව ලියැවුණ ද 'රදළ පිළිරුව' එදාට මෙන් ම අදටත් වලංගු ය. ඒ, පොදු මිනිසාගේ අනුකාරක චින්තනයෙහි කිසිදු වෙනසක් සිදුවී නොමැති නිසා ය; සිදු නොවන නිසා ය. මේ කතාවේ එන රජියෙල් බාස් හෙවත් (පසුකලෙක) රෆායෙල් උපතින්ම දිළින්දෙකි. මුලදී දිළින්දන්ව සිට ඉගෙනීමකින් හෝ දැඩි වෙහෙස මහන්සියකින් හෝ කැප කිරීමකින් හෝ තොරව උන්හිටිහැටියේ කෝටිපතියන් බවට පත්වූවන් අනුකාරකයන් බවට පත්වීමේ සම්භාවිතාවක් ද පවතී. එවැන්නන් එදාටත් වඩා දැකගත හැකි වන්නේ මෙදා ය. විශේෂයෙන් විවෘත ආර්ථිකයේ සම්ප්‍රාප්තියෙන් පසුව ය. රදළ පිළිරුවේ රජියෙල් බාස් කාලානුරූප චරිතයත් නොවන්නේ යැයි කිවහැකි නොවන්නේ ද එහෙයිනි.

> **රජියෙල් බාස් කිඹිසින්නට විය - උදේ අවදි වූ වෙලේ පටන් තොරතෝංචියක් නැතිව කිඹිසින්නට විය. ඔහුට හැදීගෙන එන්නේ, හෙම්බිරිස්සාවකි. වෙන මිනිහකුට නම්, මේ හෙම්බිරිස්සාව කරදරයකි - නිව්මෝනියා වැනි භයානක රෝගයකට වුවත්, පාර කැපෙන්නට හැකි හෙයින් පරෙස්සම් විය යුත්තකි. එහෙත්, රජියෙල් බාස්ට මේ හෙම්බිරිස්සාව ප්‍රීතියකි. ප්‍රීතියක් වුණේ, අන් කිසිවක් නිසා නොව, වැළඳුණේ, හොඳ කෙනෙකුගෙන් හෙයිනි. රදළ කෙනෙකුගෙන් වැළඳුණු හෙම්බිරිස්සාව, අහක දැමිය යුත්තක් නොවේ. දොම්නසට කාරණයක් නොවේ.**
>
> *(රදළ පිළිරුව - 1 පිටුව)*

ප්‍රභූවරයකුගෙන් කොරෝනාව වැළඳුණා යැයි කියන්නට කැමති පුද්ගලයන් මෙකල ද සිටින්නට බැරි නැත. කිඹුහුම් පිට කරමින් මිදුලට බැස්ස ද, ගෙඋයන දැකීමෙන් රජියෙල් බාස්ට රෝගය අමතක වෙයි; ඔහුගේ සිත පිනා යයි; මනහර උයනක් මැද පිහිටි මේ සොඳුරු මහමැදුර ඔහු මිලදී ගෙන සිටින්නේ රට හැර ගිය යුරෝපීය ජාතිකයකු වෙතිනි. 'බෝංමාට් හවුස්' නම් වූ මේ මහා මැදුරට සිංහල නමක් තැබීම උචිත යැයි රජියෙල් බාස්ට සිතෙන්නේ මේ කාලය වන විට දරුවනට මෙන් ම නිවෙස්වලට ද සිංහල නම් යෙදීමේ ප්‍රවණතාවක් උද්ගතව ඇති හෙයිනි. ඒ අනුව නිවෙසට හොඳ නමක් ඉල්ලා ගැනීම සඳහා ඔහු යන්නේ පන්සලේ හාමුදුරුවන් වෙත ය. හාමුදුරුවන් ඊට දුන් 'නන්දන පාය' යන නම අකුරු වචන හරි හැටි නොහඳුනන රජියෙල් බාස්ගේ සිතට එතරම් ගැළපෙන්නේ නැත. ඔහු හාමුදුරුවන්ගෙන් මෙසේ අසන්නේ ඒ නිසා ය.

'අපාය කියන එක හාමුදුරුවනේ හොඳ නෑ නෙවෙ ද?'

'අපාය කියන එක නං හොඳ නෑ තමයි' හාමුදුරුවෝ පිළිතුරු දෙති.

'ඒත් මේක නන්දන අපාය නෙවෙයි; නන්දන පායයි.'

හාමුදුරුවෝ ඉන්පසුව මේ වචන දෙක ගැන වැඩිමනත් පැහැදිලි කිරීමක් ද කරති.

'පාය කියන්නේ ප්‍රාසාදයයි. නන්දන කියන්නේ හිත සතුටු කරවන කියන එකයි.'

නන්දන පායේ වෙසෙන, දූන උගත්, පත-පොත කියවන එකම තැනැත්තිය වන්නේ නන්දා ය. නන්දාවතී කියන්නේ රපියෙල් බාස්ගේ හා හෙලේනාගේ එකම දියණියට ය. රූමත් තරුණියක වන ඇයට සියුම් රසඥතාවක් මෙන් ම සාම්ප්‍රදායික මත විනිවිද දැකීමේ හා ඒ ඇතැම් මත බණ්ඩනය කිරීමේ දිරියක් හා ශක්‍යතාවක් ද පවතී. 'සිහංල පද්‍ය කාව්‍යය' ලෙස හැඳින්වෙන පැරණි කවිපොත් පිළිබඳ ප්‍රශ්නාර්ථයක් ඇය තුළ මතුවන්නේ ද එහෙයිනි.

> **මේ කව් පොත්වල බොහෝ සේ තිබෙන්නේ, සකු-මගද දෙබසින්, වෙසෙසින්ම සකු බසින්, නොයෙක් ලෙසින් බිඳ ගත්, ශබ්දාවලියකින් කරන ලද කරනම් ගැසීමකි - පෙන්වන ලද ඉන්ද්‍රජාලයකි. එහි සියේට අනූවක් ඇත්තේ, උපචාර දර්ශනාත්මක වූ අලංකාරය පමණකි. වර්ණනාදිය-ස්ත්‍රී-නිශා උදය-වන-නගර-මාර්ග වැනි වර්ණනාදිය හැම දෙනාගේම එක හා සමාන ය. වෙනසක් දක්නා ලැබෙන්නේ, ඉතාම කලාතුරකිනි. නන්දාවතියට 'කාව්‍යය' මෙන් පිළිගැනෙන්නේ, ඡන්දසකට අනුව, අනුප්‍රාසය ඇතිව හෝ නැතිව, බඳනා ලද සිව්පද නොවේ. 'කාව්‍යය' යන්නෙන් ඇය අදහස් කරන දෙය ඊට වඩා අතිශයින් වෙනස් ය. ඉතා හොඳටත්, ඉතා රසටත්, ඉතා කොටිනුත්, ලෙහෙසියෙන් මතක හිටින හැටියටත්, වියත් බසිනුත්, යම් වැදගත් අලුත් මතයක් කල්පනාවක්-දර්ශනයක්-පද්‍යයෙන් හෝ ගද්‍යයෙන් ප්‍රකාශ වීමත්, ඒ ප්‍රකාශය අවංක වූ කරුණාවත් වූ දයාබර වූ ගුණයෙන් යුක්ත වීමත් ඇයට 'කාව්‍ය' නම් වේ. මේ උර ගලට 'සිංහල කාව්‍ය' සිටින තැන් ඇත්තේ, ඉතා ස්වල්පයකි.**
>
> *(රදළ පිළිරුව - 45 පිටුව)*

සිංහල ගද්‍යකාව්‍ය ලෙස ගැනෙන 'බණපොත්' සම්බන්ධයෙන් ද නන්දාවතී තුළ පවතින්නේ මේ ප්‍රශ්නාර්ථයම ය. මේ පොත් මැණියන්ට ඇසෙන්නට කියවන බොහෝ අවස්ථාවලදී මේ ප්‍රශ්නය ඇයට පීඩාවක් වෙයි. මේ පොත්වල බොහෝ සෙයින්, ඒකාකාරී ලෙසින් දැකගත හැකි වන්නේ හාමුදුරුවන්ට සිවුපසයෙන් උපස්ථාන කළ මිනිසුන් මරණයෙන් පසු ලැබූ පුදුම එළවනසුලු සැපසම්පත් පිළිබඳ තොරතුරුම ය. ඇයට හැඟීයන්නේ මේවා බුදුබණට මෙන් ම බුදුන්වහන්සේට ද කළ නිග්‍රහයන් ලෙසට ය.

> **මෝඩ ගිහියන් දුකසේ සරිකර ගත් දෙය එලොව පෙන්නා මෙලොව තමන් වෙත ඇද ගන්නට මේ පොත් කරන ලද බව පෙනේ.**
>
> *(රදළ පිළිරුව - 46 පිටුව)*

මේ අදහස්වලට සරිලන අදහස් උදහස් දරණ ජයවීර නම් වූ තරුණයා නන්දාවතීට මුණගස්වන්නේ ඉංග්‍රීසි උගන්වන්නට නන්දන පායට එන යුරෝපීය කාන්තාව ය. නන්දාවතී හා ජයවීර අතර හටගන්නා ප්‍රේම සම්බන්ධයට හෙලේනා ඉතා කැමැති ය. රපියෙල් බාස් මුලදී ඊට එකඟත්වය පළ කළ ද පසුව ඔහුට ඕනෑවන්නේ තමාගේ දියණිය උසස්, වැදගත් පවුලකට හෙවත් රදළයකුට විවාහ කර දීමට ය. අඩුපාඩුකම් සම්පූර්ණ වන්නට වූ දා පටන් නැති අඩුපාඩුකම් පෙනෙන්නට වී ඇත්තේ රපියෙල් බාස්ගේ දෑසට ය. සිය බිරිඳගේ - හෙලේනාගේ ගැමිකම්, නුසුදුසුකම් ද දූන් දූන් ඔහුට අහස උසට පෙනී යමින් පවතී. එහෙත් හෙලේනා කියන්නේ කිසිසේත් අස්කළ හැකි, අස් කළ යුතු බිරිඳක් නොවන බව හොඳින්ම දූන සිටින්නේ ද රපියෙල් බාස්ම ය. රටේ තොටේ දන්නා කියන හැම දෙනාම කට වචනයට කියන කතාව ඔහුට ද ආරංචි වී ඇති බැවිනි.

'රපියාට හරි ගියේ හෙලේනා නිසා.'

තමා ඇසුරු කරන ඉහළ සමාජයේ මිනිසුන් සතු ඔපය, ඒ කලඑළිය තමාට උපයා සපයාගත නොහැකිවීම නිසා හටගත් කනස්සල්ලක් රපියෙල් බාස්ට කරදර කරන අවස්ථා බොහෝ ය. මෑතකදී වැළඳුණ හෙම්බිරිස්සාවට ඉඟුරු කොත්තමල්ලි පිළියෙළ කර දෙන්නට හෙලේනා සූදානම් වෙද්දී රපියෙල් බාස් ඇය වළකයි. ඇගේ ක්‍රියා මායිම් නොකරන ඔහු වහාම කැඳවන්නේ ලොකු මිනිසුන්ගේ වෛද්‍යවරයෙක් ලෙස ප්‍රකට දොස්තර ඔලිවර් ය.

'මේ දවස්වල හැම තැනම ඉන්ෆ්ලුවෙන්සාව. බොහොම පරිස්සම් වෙන්න ඕනෑ.

කෝ බලන්න අත?' මෙසේ කියමින් දොස්තර මහතා රපියෙල් බාස්ගේ නාඩි සෝදිසි කරන්නට විය.

'කෝ බලන්න දිව?' යනුවෙන් අනතුරුව ඔහු දිව ද පරීක්ෂා කර බැලුවේ ය.

'වෙන මොක ද, තියෙන අමාරු?'

'වෙන මොකවත් නැහැ - හවස් වෙනකොට උස් මුරුතේ ටිකක් තියෙනවා' යයි රපියෙල් බාස් කී ය.

'උස් මුරුතෙ?'

'ඔව්, උස් මුරුතෙ! උස් මුරුතෙ!'

ඔලිවර් දොස්තර මහතාට රපියෙල් බාස් තේරුම් ගත නොහැකි විය. මේ, මෙවැනි බසක් ඔහු ඇසූ පළමු වන වතාව ය.

'උස් මුරුතෙ?'

'ඔව් මහත්තයා, මේ, බඩේ උස් මුරුතෙ?'

'කෝ එහෙනම් බඩ සෝදිසි කරන්න' කියමින්, මෙහිදී දොස්තර මහතා මේ පුදුම ලෙඩය උදක් හැඳින ගන්නා බලාපොරොත්තුවෙන් නැඟී සිටියේ ය.

දොස්තර මහතා නැඟී සිටියේ බලවත් පරීක්ෂණයකට ය. ලෙඩා යහනක බාවා උදරය සෝදිසි කොට, මේ පුදුම රෝගය හැඳින ගන්නා තෙක් ඔහුට ඉවසුම් නැත.

(රදළ පිළිරුව - 13 පිටුව)

ලෙඩට බෙත් මෙන් ම කුසගින්නට ආහාර ද ඉංග්‍රීසි ක්‍රමයට අවශ්‍ය වන හෙයින් රපියෙල් බාස් නන්දන පායේ පරණ මෙහෙකරුවන් ගෙදර යවයි. ඒ වෙනුවට සුදු මහත්වරුන් ළඟ වැඩ කළ කෝකියන් කැඳවයි. ඊට ද විරුද්ධ වන්නේ හෙලේනාම ය.

'උයාගත්තු දේ ලිප්බොක්කේ ඉඳගෙන කාපු අපට මේ හැටි පුරසාරම් මොනවට ද? ඒ දවස්වල බත්ටික කෑවේ මිරිස්කරල පුච්චගෙන. එතකොට ජාඩි කරවල කියන්නේ දිව බොජුන්'

බිරිඳගේ මේ අතීත වන්දනාවට ඉඳුරාම එරෙහි වන රපියෙල් බාස් ඇය සමඟ කලහයකට මුලපුරන අවස්ථා බොහෝ ය.

'තී මහා දුක් විඳින්න උපන් ගැහැනියක්' කියා රපියෙල් බාස් කලකිරුණු බවක් පෙන්වී ය.

'ඔව් මට දුක් විඳින්න පුළුවන් - සැප විඳින්නත් පුළුවන් - මේ විඳින්නේ, සැප නොවෙයි. මොකක් ද මහා සාපයකින් අපි නැත්තට නැති වෙන්නට යනවා පෙනෙන කොට, මේක සැපයක් වෙන්නේ කොහොම ද? මේ, එක එක නිළමවරුන්ගෙයි - රදළ වරුන්ගෙයි - මුදලි වරුන්ගෙයි පින්තූර මොට ද අපේ ගෙයි අපි එල්ලා ගන්නේ? වෙන පින්තූර නැත්නම්, අර අපේ ආගමේ පින්තූර ටිකක් එල්ලා ගන්නවා. නොවැ?'

(රදළ පිළිරුව - 35 පිටුව)

දියණියට රදළයකු විවාහකරදීම පිළිබඳ රපියෙල් බාස්ගේ බොළඳ සිහිනය බොඳ කර හරින්නේ ඇගේ පෙම්වතා වන ජයවීරම ය. ඔහු ඒ සඳහා පසුබිමක් නිර්මාණය කරගන්නේ ඉතා සූක්ෂ්ම ලෙසය. ඒ සඳහා ඔහු බළල් අතක් බවට පත්කරගන්නේ රපියෙල් බාස්ට ඉතාම සමීපයෙන් සිටින උභය කුලපාරිශුද්ධ වංශවතකු වන චාලි හාමු ය.

චාලිහාමු හොඳ පවුලක උපන්, නරක මිනිහෙකි. උගත්කම් ඇතත් ඒ කිසි උගත් කමකින් ඔහුට සැලකිය යුතු ප්‍රයෝජනයක් නොවී ය. එයින් වුණේ, ඔහුගේ කපට නුවණ තවත් මුවහත් වීම පමණකි.

වලව් පෙළේ කොතරම් මෝඩයකුට වුවත් කොතරම් නරකයකුට වුවත්, රජයේ කිසියම් මුල්ලක්, කුඩැල්ලකුට මෙන් යැපීම පිණිස අල්ලා ගැනීම අපහසු නොවේ. මේ පහසුකම, චාලිහාමුට ද ලැබුණේ ය. එහෙත් චාලිහාමුට එය රැක ගත නොහැකි විය.

(රදළ පිළිරුව - 67 පිටුව)

චාලිහාමුට තේරුම් යන්නේ රපියෙල් බාස් තමාට ඉතා හොඳ ඉල්ලමක් වන බව ය. ඒ රපියෙල් බාස්ගේ 'රදළ පිස්සුව' නිසාම ය. රපියෙල් බාස් රවටා මුදල් ගරාගැනීමේ කලාව ඉතා හොඳින් ප්‍රගුණ කර සිටින චාලිහාමු, 'නන්දන පාය' මිලදී ගන්නට රපියෙල් බාස්ට අවස්ථාව උදාකර දෙන්නේ ද සැලකිය යුතු මුදලක් තමාගේ සාක්කුවට වැටී යන අයුරිනි. මේ සියල්ල සොයා දැනගන්නා නන්දාගේ පෙම්වතා වන ජයවීර අපකීර්ති තර්ජනයෙන් (Blackmail කිරීමෙන්) චාලි හාමු තමා කෙරෙහි නම්මා ගන්නේ රහසිගත වැඩපිළිවෙළක් සඳහා පිඹුරුපත් සකස් කරගැනීමෙන් පසුව ය. රපියෙල් බාස්ගේ ලිපිකරුවා වන ජස්ටින් ෆොන්සේකාගේ ද සහයෙන් ඔහු ඉතා සූක්ෂ්ම ලෙස මේ සැලසුම සකස් කරයි; නන්දාවතී රදළයකුට නොව කුමාරයකුට විවාහ කරදීම සඳහා රපියෙල් බාස් තුළ බලාපොරොත්තු දැල්වීම ඔහුගේ මේ වැඩපිළිවෙළේ මූලික අරමුණකි.

දිනක් හදිසියේම වාගේ නන්දන පායට පැමිණෙන්නේ පෙර කිසි කලෙක නොපැමිණි, පෙර කිසිකලෙක නුදුටුවිරූ ස්වරූපයක් ඇති අමුතුම පුද්ගලයෙකි. රන්කම් කළ සේද සරමක් වැනි රතු වස්ත්‍රයක් හැඳසිටින ඔහුගේ හිස වැසී ඇත්තේ දේවදූතයන් පළඳන ආකාරයේ කිරුළක් වැනි හිස්වැස්මකිනි. ඔහු අනාරාධනයෙන්ම පුටුවක වාඩිවී හිතෙෂිව හිනැහෙයි.

'ඇයි, අඳුනන්නේ නැද්ද මාව?' යනුවෙන් මෙසේ හිඳ ගත්, දේව දූතයා වැනි අමුත්තා, සිනා මුසු බැල්මෙන් රපියෙල් බාස් ප්‍රශ්න කළේ ය.

'නැහැ!' පුදුමයෙන් මත් වූ ගමන් පිළිමයක් මෙන් සිටි රපියෙල් බාස් පිළිතුරු දුන්නේ ය.

(රදළ පිළිරුව - 286 පිටුව)

කුඩා කාලය ගැනත්, ගම ගැනත්, දන්නා හඳුනන මිනිසුන් පිළිබඳවත් දීර්ඝ ආවර්ජනයක් එළි දැක්වීමෙන් පසු අද්භූත ආගන්තුකයා පවසන්නේ තමා විසි අවුරුද්දකට පෙර රටින් පිටවූ බව ය; සියම් රටට ගිය බව ය; විසි අවුරුද්දක්ම තමා මෙහෙ කළේ සියම් රටේ රජවාසලට යැයි කියා ය.

'බොහොම හොඳයි, ඇදින ගන්න ලැබුණු එක. ඉතින් මෙහෙ ආවේ?' රපියෙල් බාස් ද සමීප ආසයක හිඳ ගනිමින් ඇසුවේ ය.

'මෙහෙ ආවේ' කියමින් අමුත්තා මඳක් කතා නැතිව සිට, 'ගිය සුමානේ ලංකාවට ගොඩ බැස්ස සියම් කුමාරයා සමඟ' යයි කීයේ ය.

'සියම් කුමාරයෙක් ගොඩ බැස්සා ද ගිය සුමානේ, ලංකාවට?' කියමින් රපියෙල් බාස් කලබල විය.

'ඇයි, දන්නේ නැද්ද?' මෙසේ ප්‍රශ්න කොට, අමුත්තා යළිත් 'ඕහ්! කුමාරයා ගොඩ බැස්සේ අප්‍රසිද්ධියේ, ඒ නිසයි දැනගංට ලැබිලා නැත්තේ. දැන් කුමාරයා නැවතිලා ඉන්නේ, මහනුවර රජවාසල. එන සුමානේ සිය රට බලා ආපසු යනවා. පිනක හැටි! බාස් උන්නැහේට වෙන්න යන්නේ, මේ ළඟදී කිසි ම සිංහලයෙකුට වුණේ නැති ලොකු වාසියක්'

(රදළ පිළිරුව - 287 පිටුව)

රාජකීය අමුත්තන්ගේ පැමිණීම නිරතුරුව අපේක්ෂා කරන රපියෙල් බාස් තුළ පුදුමය තරමට ම වර්ධනය වන්නේ බලාපොරොත්තුවකි. රාජකීය උත්තමයන් දැකීම පවා මහත් භාග්‍යයක් කොට සලකන රපියෙල් බාස්ට අමුත්තා කියා සිටින්නේ සිත ප්‍රමුදිතකරවනසුලු කතාවකි. හොඳ බෞද්ධයෙක් වන (ඔටුන්න හිමි) සියම් කුමාරයාට කටුගෙය ළඟදී සිංහල කුමාරිකාවක් අහම්බෙන් දකින්නට ලැබී ඇතැයි ද, කුමාරයා තුළ ඇය පිළිබඳ මහත් කැමැත්තක් හටගැනී ඇතැයි ද අමුත්තා කියා සිටී.

> **'කුමාරයා මට කීවා ඇය ගැන සොයා බලන්නට කියා. ඉතින් මා සොයා බැලුවා. බලන කොට බාස් උන්නැහේගේ දෝණියන්ඳට නොවැ කුමාරයාගේ හිත වැටිලා තියෙන්නේ.'**

රපියෙල් බාස් එතැන් පටන් හැසිරෙන්නේ, ක්‍රියාකරන්නේ සැබෑම පිස්සුවකින් වාගේ ය. මලපොතේ අකුරක් නොදන්නා ඔහුට සියම් දූතයා පෙනීයන්නේ ඉෂ්ට දේවතාවකු ලෙස ය. සියම් කුමාරයා පිළිගැනීමට මෙන් ම මංගල උත්සවය සංවිධානයට ද ඔහු විශාල මුදලක් වෙන් කරයි. කිසිවක් නොදන්නා නන්දාවතී මෙන් ම හෙලේනා ද සියම් කුමාරයා කෙරෙහි දක්වන විරෝධය තුට්ටුවකට මායිම් නොකරන රපියෙල් බාස්, කුමාරයා පිළිගන්නා ආකාරය ගැන ඉතා පරිස්සමින් අසා දැනගන්නේ ද සියම් දූතයාගෙනි. සියම් දූතයා කැඳවාගෙන ආ සියම් පුරෝහිතයා සියම් බස හසුරුවන්නේ අමුතුම ආකාරයකට ය.

'බන් ගෝස්. හිගී නැටින්'

මේ අපූරු සියම් බසේ සිංහල අර්ථය සම්පාදනය වන්නේ පද පෙරළියකිනි.

'ගොං බාස් නැගී හිටින්'

සියම් කුමාරයා පැමිණි වෙලේ රපියෙල් බාස් ගෞරවසම්ප්‍රයුක්තව නැගී සිටින්නේ සියම් දූතයා එය සිංහලට පෙරළා දුන් පසුව ය. රපියෙල් බාස්ට ප්‍රීතිය දරාගත නොහැකි ය. **'මට (ප්‍රීති) සංවේගය නිසා මුකුත්ම කියා ගන්න බෑ. ඒ නිසා කියන්න කුමාරයන් වහන්සේට මගේ ජීවිතය පිදුවා කියා'** යි ඔහුට කියාගත හැකිවන්නේ කතාකරගන්නට හැකිවූ විට ය.

'පීඩ මොස්සා' (මෝඩ පිස්සා) යි දූතයා කියයි.

මෙවැනි පදපෙරළි ගණනාවක්ම ඔවුන් අතරේ හුවමාරු වෙයි. සියම් කුමාරයා ලෙස වෙස්වළාගෙන එන්නේ ජයවීර ය. ඔහුගේ හිසෙහි උස තොප්පියකි; දෑස් මුළුමනින්ම වැසී ඇත්තේ කළු කණ්ණාඩි යුවලකිනි. කිසිවක්ම නොදන්නා නන්දාවතී සියම් කුමාරයාගේ වේශයෙන් තැතිගනියි; හෙලේනා ආඩපාලි කියන්නට වෙයි. ඔවුනට රහස හෙළිවන්නේ ටික වෙලාවක් ගතවූ පසු චාලි පැවසූ රහසකිනි. ඉනික්බිතිව රපියෙල් බාස් තුළ ද සතුට දනවමින් නන්දාවතී විවාහයට අත්සන් තබන්නේ සිනාමුසු මුහුණකිනි.

> **'තාත්තාට බොහොම ස්තුතියි - මා පතා ගත් මේ කුමාරයා මට ලබා දුන්නාට තාත්තාට බොහොම ස්තුතියි' කියා නන්දාවතී පියාණන් දෙපතුළ වැටී වැන්දා ය.**
>
> **රපියෙල් බාස් ගල්ගැසී බලා සිටින විට, චාලිහාමු මෙසේ කීයේ ය.**
>
> **'මිස්ටර් රෆායෙල් ඔවුංට ඔබගේ ආශීර්වාදය දැන්ම දිය නොහැකි නම් පසුව හෝ දුන මැනවි. එහෙත් ඔවුනට සාප නොකළ මැනවි. සාප කරනු කැමැති නම් මට සාප කළ මැනවි. මේ ප්‍රයෝගයට වග කියයුත්තා මා ය.**
>
> *(රදළ පිළිරුව - 342 පිටුව)*

රපියෙල් බාස්ගේ රදළ පිස්සුව මුළුමනින්ම සුව වන්නේ මේ නාටකයෙන් පසුව ය. 'රදළ පිළිරුව' නවකතාව හඳුනාගත යුතුවන්නේ අනුකාරක චින්තනයට (අනුකාරකයන්ට) ඩබ්ල්යූ. ඒ. සිල්වා එල්ල කළ ඉසියුම් ප්‍රහාරයක් ලෙස ය. 'රදළ පිළිරුව' නවකතාව සිනමාවට නැගුණේ, ප්‍රදර්ශනය කෙරුණේ බොහෝ කාලයකට පෙර ය. මේ නවකතාව කියවූවන් හෝ ඒ චිත්‍රපටය

නැරඹූවන් හෝ මේ වන විට සිටින්නේ නම් ඒ අතළොස්සක් පමණක් විය හැකි ය. මෙය යළි තියරට නැගිය යුතු නොවන්නේ දැයි අඩමානයට වාගේ අපට සිතෙන්නේ චිත්‍රපට කර්මාන්තයේ පැවැත්ම සඳහා ද මෙවැනි චිත්‍රපටවල අවශ්‍යතාව පැහැදිලි කරමින් ඇති නිසා ය. හාස්‍යෝත්පාදක නවකතා තරමට ම දුර්ලභ නොවුණ ද, හොඳ මට්ටමින් උපහාස රසය කරළියට නැගූ චිත්‍රපටයක් අපට දැකගන්නට ලැබී ඇත්තේ ද ඉතා කලාතුරකිනි.

කෙසේ වුව ද වැදගත්ම කරුණ වන්නේ හාස්‍යෝත්පාදක චිත්‍රපටයක් නිපදවීමව යැයි කියන්නේ සෙල්ලම් වැඩකට නොවන බව තේරුම් ගැනීම ය.

කැත්ලීන් ජයවර්ධන
printgraphic2@gmail.com